දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, **Fax**: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல / Your No. ..........................................

**අධ්‍යාපන අමාත්‍යාංශය**
**கல்வி அமைச்சு**
**Ministry of Education**

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
"இசுருபாயா" ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No.: ED/1/14/04/05

දිනය / திகதி / Date: 2013.05.29

චක්‍රලේඛ අංකය: 2013/24

ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
විභාග කොමසාරිස් ජනරාල්
සියළු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියළු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියළු ම කළාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා
සියළු ම විදුහල්පතිවරුන් වෙත

**අ.පො.ස. උසස් පෙළ සංශෝධිත විෂය නිර්දේශ අනුව 2013 වර්ෂයේ සිට රසායන විද්‍යාව හා ජීව විද්‍යාව විෂයයන් ඇගයීම**

1. අ.පො.ස. උසස් පෙළ රසායන විද්‍යාව හා ජීව විද්‍යාව නව විෂයය නිර්දේශයන්හි ඇතැම් විෂයය කොටස් 2011 වර්ෂයේ අ.පො.ස. උසස් පෙළ විභාගයේ දී ඇගයීමට ලක් නොකරන ලදි.

2. එහෙත් මාගේ 2012.03.22 දිනැති 3012/12 චක්‍රලේඛය මගින් 2013 වර්ෂයේ දී සංශෝධිත (පසු විමසුම් කරන ලද - revisited) විෂයය නිර්දේශය අනුව ඇගයීම සිදු කෙරෙන බව දැනුම් දී ඇත.

3. එසේ වුවත් 2011 වර්ෂයේ දී ප්‍රථම වරට විභාගයට පෙනී සිටි සිසුන් සඳහා ඇගයීමෙන් ඉවත් කළ විෂයය කොටස් විෂයය නිර්දේශයෙන් ද ඉවත් කර තිබූ බැවින් 2013 වර්ෂයේ දී එම සිසුන් දෙවන වර විභාගයට පෙනී සිටීමේ දී අසාධාරණයක් වීම වැළැක්වීම සඳහා 2013 වර්ෂයේ දී ද එම විෂයය කොටස් ඇගයීමට ලක් නොකෙරේ.

4. 2014 වර්ෂයේ දී සහ ඉන් ඉදිරියට පැවැත්වෙන උසස් පෙළ විභාගවලදී සංශෝධිත (පසු විමසුම් කරන ලද - revisited) විෂයය නිර්දේශය අනුව ඇගයීම සිදු කෙරේ.

5. මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් පැහැදිලිව ගුරුවරුන්ට සහ සිසුන්ට ලබාදී එම උපදෙස් ලබා දුන් බවට වාර්තාවක් තබා ගන්නා ලෙස මෙමගින් විදුහල්පතිවරුන්ට දැනුම් දෙනු ලැබේ.

එස්. එම්. ගෝටාභය ජයරත්න
අධ්‍යාපන ලේකම්